විධායක ජෙනරල් ශාඛාව
යුද්ධ හමුදා මූලස්ථානය
කොළඹ

විජෙශා/උපදෙස්/පා/01 (    )

සියළු ස්ථාන (නාවික/ගුවන් හැර)

2015 ඔක්තෝබර් මස 20 දින

**පරිපාලන උපදෙස් - ඒකක අඩු කිරීම්/අනිවාර්ය ඉතිරිකිරීම් ගිණුම**

යොමුව:
අ. විජෙශා/උපදෙස්/පා/01 (05) හා 2015.08.03 දිනැති මෙම ශාඛා ලිපිය.

1. යොමුගත ලිපිය මගින් ඒකක අඩුකිරීම්/මරණාධාර යෝජනා ක්‍රම සහ අනිවාර්ය ඉතිරි කිරීම සබැඳිව උපදෙස් ලබාදී ඇත.

2. කරුණු එසේ වුවද රෙජිමේන්තු අධිපතිවරුන් වෙතින් යුද්ධ හමුදාධිපති වෙත කරන ලද ඉල්ලීම් වලට අනුව යොමුගත ලිපියේ ඡේද අංක 2 (අ) සහ (ආ) යටතේ දක්වා ඇති කරුණු පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය.

අ. **ඒකක අඩු කිරීම් - යොමුගත ලිපියේ 2 (අ) ඡේදය**

(1) කිසිදු හේතුවක් මත පහත සඳහන් කරුණු සඳහා නිලධාරි/සෙසුනිලයින්ගේ මාසික වැටුපෙන් මුදල් අඩුකිරීම සපුරා තහනම් වේ. තවද රෙජිමේන්තු අධිපතිගේ පූර්ණ අනුමැතිය මත ඒකක අඩු කිරීම් යටතේ යොමුගත ලිපියේ සඳහන් මුදල් වලට අමතරව අනෙකුත් අවශ්‍යතාවයන් සඳහා වැටුපෙන් මුදල් අයකර ගත හැක.

(අ) සමරු තිළිණ අලෙවි කිරීම.
(උදා: බලඇණි දින වෙනුවෙන් තිළිණ ලබාදීම, ක්‍රීඩා ඇඳුම් කට්ටල මැසීම, සමරු පොත් මුද්‍රණය වැනි ක්‍රියාවන්)

(ආ) රෙජි/ඒකක මුදල් ඉපයීමේ ව්‍යාපෘති වලට සහ විවිධ වර්ගයේ ලොතරැයි පත් වෙනුවෙන් මුදල් එකතු කිරීම.

(ඇ) රෙජි/ඒකක මුදල් ඉපයීමේ ව්‍යාපෘති සඳහා වන අනුග්‍රාහක දායකත්වයන් වෙනුවෙන් නිලධාරි/සෙසුනිලයින්ගේ වැටුපෙන් මුදල් අඩු කිරීම.

(ඈ) නිලධාරි/සෙසුනිලයින් පුද්ගලිකව සහභාගී නොවන සාදයන් සඳහා මුදල් අඩු කිරීම.

ආ. **අනිවාර්ය ඉතිරි කිරීම් - යොමුගත ලිපියේ 2 (ආ) ඡේදය**

(1) යොමුගත ලිපියේ 2 (ආ) ඡේදය යටතේ දක්වා ඇති ඉතිරි කිරීම් සඳහා ලබාදී ඇති සියළු උපදෙස් මින් අවලංගු කරන අතර, පහත සඳහන් කරුණු වලට යටත්ව රෙජි/ඒකක අනිවාර්ය ඉතිරි කිරීම සබැඳිව මින් ඉදිරියට ක්‍රියාකළ යුතුය.

(අ) ඒකක අනිවාර්ය ඉතිරි කිරීම් ගිණුම් පවත්වාගෙන යනු ලබන රෙජිමේන්තු/ඒකකයන්හි සාමාජිකයින්ගේ ඉතිරි කිරීම් මුදල් ශේෂයන් සඳහා යුධ සහසාධක අරමුදල වෙතින් සහ බැංකු ක්ෂේත්‍රය වෙතින් ලබාදෙන වැඩිම පොලී ප්‍රතිශතයට සාපේක්ෂව ඉහළ පොලී අනුපාතයක් ලබාදීමට කටයුතු කළ යුතුය.

(ආ) ඒකක අනිවාර්ය ඉතිරි කිරීම් ගිණුමේ මුදල් ශේෂයන් හෝ එම ගිණුමේ මුදල් මූල්‍යමය ආයතන වල තැන්පත් කර ලැබෙන සියළු පොලී මුදල් කිසිදු අවස්ථාවකදී කිසිදු වෙනත් කටයුත්තක් සඳහා නොයෙදීම (ගොඩනැගිලි ඉදිකිරීම්, ආදායම් මුදල් ඉපයීමේ ව්‍යාපෘති, වෙනත් උත්සව කටයුතු).

(ඇ) මෙම අරමුදල වෙනුවෙන් රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙතින් පත්කරනු ලබන ගිණුම් කළමණාකරණ කමිටු මණ්ඩලය සඳහා ස්වාධීන සාමාජිකයෙකු ලෙස මූකයා වෙතින් අධීක්ෂණය සඳහා නම් කරනු ලබන ගණක නිලධාරියෙකු පත්කිරීම.

(ඈ) සෑම අඩ වසරකට වරක් ගිණුම අවිඅම විගණනයට ලක්කිරීම.

(ඉ) අනිවාර්ය ඉතිරි කිරීම් සඳහා මාසිකව සාමාජිකයින් විසින් ගෙවනු ලබන මුදල ඔවුන්ගේ කැමැත්ත ප්‍රකාශිත සහතිකයක් මත වැටුපෙන් අයකර ගැනීම.

(ඊ) මෙම ගිණුමට සාමාජිකයින් විසින් මාසිකව බැර කරනු ලබන මුදල් ස්ථාවර තැන්පත් වල හෝ වෙනත් තැන්පතු වල තැන්පත් කිරීමෙන් උපයන සියළු පොලී මුදල් සාමාජිකයින් වෙතම පොලී ප්‍රතිලාභ වශයෙන් ලබාදීම.

(උ) විෂයගත ගිණුම වෙතින් සාමාජිකයින් හට ණය පහසුකම් ලබාදෙන්නේ නම් එම ණය පහසුකම් සඳහා සාමාජිකයින් විසින් ගෙවනු ලබන පොලියෙහි සියළු ලාභාංශද සාමාජිකයින් වෙත ප්‍රතිලාභ ලෙස ලබාදීම.

(ඌ) වාර්ෂිකව සාමාජිකයාට හිමි අනිවාර්ය ඉතිරි කිරීම් ගිණුමේ-ශේෂය සහ පොලිය (ගිණුමට හිමි ගිණුම් සාරාංශ වාර්තාව) ඔහු වෙත ලිපිතව ආරක්ෂක කවරයක බහා ලබාදීම.

(එ) . ගිණුමේ නඩත්තු කටයුතු සඳහා වාර්ෂික පොලියෙන් 0.25% ක මුදලක් ගිණුම වෙතින් වැය කිරීමට අවකාශය සැලසීම.

(ඒ) සියළුම අනිවාර්ය ඉතිරි කිරීමේ ගිණුම් සඳහා ඉහත කරුණු වලට යටත්ව නව ව්‍යවස්ථාවක් සකස්කොට එම ව්‍යවස්ථාව මූකයා නිර්දේශය සහිතව යුද්ධ හමුදාධිපතිගේ පූර්ණ අනුමැතියෙන් පසුව පමණක් ඉදිරියට පවත්වාගෙන යාම.

3. තවද, 2015.11.01 දින සිට ඉහත උපදෙස් වලට පටහැනිව ක්‍රියාකර තිබීක්ෂණය වුවහොත් ඒ සඳහා ශ්‍රීලංකා පොලිස් විමර්ශණයක් මගින් ඉදිරි විනය ක්‍රියාමාර්ග සිදුකරන ලෙස යුද්ධ හමුදාධිපති තුමා විසින් දැනුම් දී ඇති බව වැඩිදුරටත් දන්වා සිටිනු ලැබේ.

4. ලිපිය ලද බවට සනාථ කරන්න.

එම් හතුරුසිංහ ආර්එස්පි එන්ඩීසි අයිපී
මේජර් ජෙනරල්
විධායක ජෙනරල්

පිටපත්:

මූකයා - 2 'ආ' (I) හි අනුඡේද (ඇ) අනුව ස්වාධීන සාමාජිකයෙකු ලෙස අධීක්ෂණය සඳහා ගණක නිලධාරියෙකු නම් කිරීම.

අවිඅම - 2 'ආ' (I) හි අනුඡේද (ඈ) අනුව සෑම අඩවසරකම ගිණුම් පරීක්ෂණයට ලක්කල යුතුය.

වැතාලේඅම - යොමුගත ලිපියේ සඳහන් කරුණු වලට අමතරව මෙම ලිපියේ 2 'ආ' (I) හි (අ) අනුඡේදය අනුව රෙජිමේන්තු අධිපතිවරුන්ගේ පූර්ණ අනුමැතිය මත ඔබ වෙත ලැබෙන ඒකක අනු කිරීම් සඳහා ක්‍රියා කල යුතුය

යුධ යහසාධකඅංශ - මේ වන විට යහසාධක අරමුදල වෙත ඉහත ගිණුම් වලට අදාල මුදල් තැන්පත් කර ඇති රෙජිමේන්තු වෙත ඔවුන්ගේ ඉල්ලීම පරිදි එම තැන්පතු [redacted] සිදුකල යුතුය.